සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# மேல் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education - Western Province

## වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
## ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
## Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 09

විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය

පත්‍රය / வினாத்தாள் / Paper: I, II

කාලය / காலம் / Time: පැය 2 යි

නම / பெயர் / Name: ........................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: ........................................

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් එක් එක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- **එක් නිවැරදි පිළිතුරකට ලකුණු 2 බැගින් ලකුණු 40 කි.**

01. බුදුරජාණන් වහන්සේ පිරිනිවීමට පෙර රහත් වන්නෙමි'යි සිතා බවුන් වඩන ලද්දේ,
   1. ආනන්ද තෙරුන් වහන්සේ විසිනි.
   2. ධම්මාරාම තෙරුන් වහන්සේ විසිනි.
   3. සුභද්‍ර තෙරුන් වහන්සේ විසිනි.
   4. චන්න තෙරුන් වහන්සේ විසිනි.

02. සැදැහැතියන් විසින් දැක සංවේග උපදවා ගතයුතු ස්ථාන හතරක් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එම ස්ථාන හතර කුමක් ද?
   1. ලුම්බිණි සල් උයන, ඉසිපතන මිගදාය, උපවත්තන සල් උයන, ඉසිගිලි පර්වතය
   2. ලුම්බිණි සල් උයන, ඉසිපතන මිගදාය, උපවත්තන සල් උයන, බේලුවගම
   3. ලුම්බිණි සල් උයන, බුද්ධගයාව, ඉසිපතන මිගදාය, උපවත්තන සල් උයන
   4. ලුම්බිණි සල් උයන, ඉසිපතන මිගදාය, උපවත්තන සල් උයන, කාලසිලාව

03. මෙලොව පරලොව සැප පිණිස පිළිගන්වනු ලබන දානය පිළිගැනීමට සුදුසු හෙයින් මහා සංඝ රත්නය,
   1. ආහුනෙය්‍ය වන සේක.
   2. පාහුනෙය්‍ය වන සේක.
   3. දක්ඛිණෙය්‍ය වන සේක.
   4. අඤ්ජලිකරණීය වන සේක.

04. බුදුරජාණන් වහන්සේ තම සසුනේ සිව්වනක් පිරිස අතුරින් සුදුසුකම් ඇති අයට විවිධ තනතුරු පිරිනැමූ සේක. ඒ අනුව 'චිරරාත්‍රඥ' භික්ෂුණීන් වහන්සේලා අතර අගතනතුර හිමිවූයේ,
   1. මහාප්‍රජාපතී ගෝතමී තෙරණියට ය.
   2. උප්පලවණ්ණා තෙරණියට ය.
   3. භද්දා කච්චානා තෙරණියට ය.
   4. ඛේමා තෙරණියට ය.

05. තම සිත නොයෙක් අරමුණු කරා විසිරී යාම නිසා අධ්‍යාපන කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකිව පසුතැවෙන ඔබගේ මිතුරෙකුට ඒ සඳහා ලබාදිය හැකි හොඳම උපදේශය වන්නේ,
   1. ආහාර පාලනය කිරීමයි.
   2. කායික ව්‍යායාම කිරීමයි.
   3. නිවැරදි ඉරියව් පැවැත්වීමයි.
   4. භාවනා කිරීමයි.

06. සතර බ්‍රහ්ම විහරණවලට අයත් අන් අයට විපතක් කරදරයක් ඇති වූවිට එයින් මුදවා ගැනීමට ඉදිරිපත් වීමේ උතුම් බෝසත් ගුණය හැඳින්වෙන්නේ,
   1. මෙත්තා යනුවෙනි.
   2. කරුණා යනුවෙනි.
   3. මුදිතා යනුවෙනි.
   4. උපෙක්ඛා යනුවෙනි.

07. ''ඵුට්ඨස්ස ලෝක ධම්මේහි - චිත්තං යස්ස න කම්පති'' මංගල සූත්‍රයේ සඳහන් වන මෙම ගාථාවේ 'ඵුට්ඨස්ස ලෝක ධම්ම' යනුවෙන් සඳහන් වන්නේ,
   1. සප්ත අපරිහානිය ධර්මයි.
   2. පංච නියාම ධර්මයි.
   3. අෂ්ට ලෝක ධර්මයි.
   4. පංච නීවරණ ධර්මයි.

08. විමුක්තිය බලාපොරොත්තු වන පුද්ගලයකු විසින් අනුගමනය කළ යුතු මාර්ගය කුමක් ද?

1. අනුසෝතගාමී ප්‍රතිපදාවයි.
2. මධ්‍යම ප්‍රතිපදාවයි.
3. අත්තකිලමථානු යෝගයයි.
4. කාමසුඛල්ලිකානු යෝගයයි.

09. කායික හා මානසික නිරෝගීකම අගය කළ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා වීම පිණිස විනය නීති රැසක් ද පනවා තිබේ. ඒ අනුව ඔබගේ කායික නිරෝගීකම ඇතිකර ගැනීම පිණිස ආහාර පරිභෝජනයේ දී ඔබ විසින් කළයුතු වන්නේ කුමක් ද?

1. රසවත් ආහාර අනුභව කිරීමයි.
2. ශරීරයට හිතකර ආහාර අනුභව කිරීමයි.
3. ඕනෑම ආහාරයක් අනුභව කිරීමයි.
4. කෘත්‍රිම රසකාරක යෙදූ ආහාර අනුභව කිරීමයි.

10. 'යම් සේ එකිනෙකාට බැඳුණු අන්ධයින් වැලක් වේ ද, එහි පළමු අන්ධයා ද මග නොදකියි. මැද සිටින අන්ධයා ද මග නොදකියි. අග සිටින්නා ද නොදකියි' බුදුරජාණන් වහන්සේ මෙම උපමාවෙන් විස්තර කර ඇත්තේ,

1. අමූලිකා ශ්‍රද්ධාවයි.
2. ආකාරවතී ශ්‍රද්ධාවයි.
3. ආගම ශ්‍රද්ධාවයි.
4. අධිගම ශ්‍රද්ධාවයි.

11. බුදුරජාණන් වහන්සේ ලක්දිවට තෙවරක් වැඩම කළ බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. ඒ අනුව බුද්ධත්වයෙන් නව වන මස යක්ෂයින් දමනය කිරීම පිණිස වැඩම කොට වදාළේ,

1. මහියංගනයට ය.
2. නාගදීපයට ය.
3. කැලණියට ය.
4. මුතියංගනයට ය.

12. බුදු දහමේ සඳහන් 'ලෝක පාලක ධර්ම' යනු,

1. යස හා අයස වේ.
2. සිරිත් හා විරිත් වේ.
3. හිරි හා ඔත්තප්ප වේ.
4. කුසල හා අකුසල වේ.

13. ශ්‍රී ලාංකේය සාහිත්‍යය පෝෂණය වූයේ බුදු දහමේ ආභාසයෙනි. එසේ රචනා වූ ග්‍රන්ථ කීපයක නම්, කතුවරුන් හා සාහිත්‍ය යුග කීපයක් පහත දැක්වේ.

A. අමාවතුර, ගුරුළුගෝමී පඬිතුමා, පොළොන්නරු සාහිත්‍ය යුගය.
B. සද්ධර්මරත්නාවලිය, ධර්මසේන හිමි, කුරුණෑගල සාහිත්‍ය යුගය.
C. කව්සිළුමිණ, විද්‍යාචක්‍රවර්තී පඬිතුමා, දඹදෙණිය සාහිත්‍ය යුගය.
D. බුදුගුණාලංකාරය, වීදාගම මෛත්‍රීය හිමි, කෝට්ටේ සාහිත්‍ය යුගය.

මෙහි සාහිත්‍ය ග්‍රන්ථයේ නම, කතුවරයා හා සාහිත්‍ය යුගය නිවැරදිව දැක්වෙන පිළිතුරු වන්නේ,

1. A හා B ය.
2. A හා C ය.
3. B හා C ය.
4. A හා D ය.

14. 'දානං සීලං පරිච්චාගං....' යන ගාථාවේ අන්තර්ගත දහම් කරුණු වන්නේ,

1. දස පාරමිතා ය.
2. දස රාජ ධර්මයන් ය.
3. දස පුණ්‍යක්‍රියා ය.
4. දස සක්විතිවත් ය.

15. සද්ධා, සීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා යන කරුණු දහමේ දක්වා ඇත්තේ පුද්ගලයාට ඇති,

1. උතුම් බල හතක් ලෙස ය.
2. උතුම් ධන හතක් ලෙස ය.
3. උතුම් සැප හතක් ලෙස ය.
4. උතුම් ඥාන හතක් ලෙස ය.

16. 'යේ ධම්මා හේතුප්පභවා....' යන ගාථාවෙන් තම ශාස්තෘවරයාත්, ශාස්තෘවරයාගේ දහම පිළිබඳවත් හැඳින්වීමක් කරන ලද්දේ,

1. අස්සජි හිමියන් විසින් උපතිස්ස පිරිවැජියාට ය.
2. අස්සජි හිමියන් විසින් කෝලිත පිරිවැජියාට ය.
3. සංජය පිරිවැජියා විසින් උපතිස්ස පිරිවැජියාට ය.
4. සංජය පිරිවැජියා විසින් උපක ආජීවකයාට ය.

17. ආර්ය අෂ්ටාංගික මාර්ගය සීල, සමාධි, ප්‍රඥා යනුවෙන් ත්‍රිශික්ෂාවට බෙදේ. මෙහි සීල ශික්ෂාවට අයත් අංග නම්,

1. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා වේ.
2. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව වේ.
3. සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි වේ.
4. සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති වේ.

18. පව්කම් නොකිරීම, පව්කම් නොකරවීම හා අන් අය පව්කම් කරන විට අනුමත නොකිරීම දහමේ හඳුන්වන්නේ,

1. අධිපති ධර්ම ලෙස ය.
2. නියාම ධර්ම ලෙස ය.
3. අත්තූපනායික ධර්ම ලෙස ය.
4. ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය ලෙස ය.

19. සන්තුස්සක, සුභර, අප්පකිච්ච, සන්තින්ද්‍රිය ආදි අප තුළ ඇතිකරගත යුතු උතුම් ගුණාංග රාශියක් කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් වී ඇත. මෙහි 'සන්තුස්සක' යන්නෙහි අර්ථය වන්නේ,

1. පහසුවෙන් පෝෂණය කළහැකි බවයි.
2. ලද දෙයින් සතුටු වීමයි.
3. ඉන්ද්‍රිය සංවරයයි.
4. කටයුතු බහුල නොවීමයි.

20. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම, කීර්තිය පැතිරීම, ඕනෑම පිරිසක් ඉදිරියට නිර්භයව එළඹීමට හැකිවීම, සිහිමුලා නොවී කලුරිය කිරීම, මරණින් මතු සුගතියේ ඉපදීම යන ආනිශංස ලැබීමට ඔබ කළ යුතු වන්නේ,

1. දන්දීමයි.
2. සිල් ආරක්ෂා කිරීමයි.
3. භාවනා කිරීමයි.
4. ධ්‍යාන උපදවා ගැනීමයි.

(ලකුණු 2x20=40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, සෙසු ප්‍රශ්න හතර සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.**

01. තෙවන වාරය සඳහා ඔබ පන්ති කාමරයේ සිදුකරන ලද පාසල් පාදක ඇගයීම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඇගයීම සඳහා යොදාගත් පෙළපොතේ සඳහන් පාඩමේ නම කුමක් ද?

ii. ඇගයීම සඳහා ඔබ විසින් සිදුකළ ක්‍රියාකාරකම කුමක් ද?

iii. එම ක්‍රියාකාරකම සිදුකිරීමෙන් ඔබ තුළ ගොඩනැගුණු කුසලතා දෙකක් ලියා දක්වන්න.

iv. මෙම ඇගයීම සිදු කිරීම සඳහා ඔබට ගුරුතුමා / ගුරුතුමිය ලබාදුන් උපදෙස් දෙකක් ලියන්න.

v. මනෝ පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චේ පදුට්ඨේන - භාසති වා කරෝති වා
තතෝ නං දුක්ඛ මන්වේති - චක්කංව වහතෝ පදං
ඉහත ගාථාවේ සඳහන් පරිදි අප කරන හොඳ හෝ නරක ක්‍රියාවලට මුල්වන්නේ කුමක් ද?

vi. එම ගාථාවට අනුව අප කරන නරක ක්‍රියාවල විපාක අප පසුපස පැමිණ දුක් විපාක ලබා දෙන අයුරු දැක්වෙන උපමාව ලියා දක්වන්න.

vii. මෙම ගාථාවෙන් ඔබේ දිවියට ගතහැකි ආදර්ශ දෙකක් ලියන්න.

viii. බුදුරජාණන් වහන්සේට පවා පෙර කරන ලද අකුසල කර්ම විපාක දුන් බව දහමේ සඳහන් වේ. එසේ උන්වහන්සේට අකුසල කර්ම විපාක දුන් අවස්ථා දෙකකට නිදසුන් ලියන්න.

ix. කර්මය හා විපාකය පිළිගන්නා ඔබට සිදු කළ හැකි යහපත් ක්‍රියාවන් දෙකක් ලියන්න.

x. දස කුසල ක්‍රියා අතුරින් දෙකක් ලියන්න. (ලකුණු 2x10=20)

02. ගැටලු විසඳීමට බුදුරජාණන් වහන්සේ අනුදත් සසුන් පිළිවෙත ධර්ම සංගායනා පැවැත්වීමයි. එසේ පැවැත්වූ,

i. තෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් ප්‍රධාන හේතුව කුමක් ද? (ලකුණු 02)

ii. එම සංගායනාවේ ප්‍රධානත්වය ගත් රහතන් වහන්සේ, පැවැත්වූ ස්ථානය, දායකත්වය දැරූ රජතුමා නම් කරන්න. (ලකුණු 03)

iii. ඔබ පන්ති නායකයෙකු හෝ නායිකාවක යැයි සිතා ඔබේ පන්තියේ සිසුන් දෙපිරිසක් අතර ඇතිවූ ගැටලුවක් විසඳීමට ඔබට භාර වුවහොත් ධර්ම සංගායනා ආදර්ශයට ගෙන එය විසඳන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 05)

03. පුද්ගලයාගේ දෙලොව දියුණුවට සදුපදේශ (යහපත් උපදේශ) සපයන ධම්මපදය බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථයයි. එහි ඇතුළත්,

i. 'සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච....' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ සරල අදහස ලියන්න. (ලකුණු 03)

iii. මෙම ගාථාවෙන් ලබා දෙන උපදේශයට අනුව අයහපත් ක්‍රියාවලින් මිදී යහපතෙහි යෙදීමේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 05)

04. සංවර්ධිත සමාජයක කැඩපත ආධ්‍යාත්මික ශක්තියයි. ඒ සඳහා සිගාලෝවාද සූත්‍රයෙන් පෙන්වා දී ඇති පරිදි අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් මැනවින් ඉටුකළ යුතු ය.

i. බුදුරජාණන් වහන්සේ යුතුකම් හා වගකීම් ඇතුළත් සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ කවුරුන් අරබයා ද? (ලකුණු 02)

ii. එම සූත්‍රයට අනුව පැවිදි අයගෙන් ගිහි අයට ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. කිසියම් ආගමික හෝ ශාසනික කටයුත්තක් සඳහා ඔබේ නිවසට වැඩම කරන ස්වාමීන් වහන්සේ නමක් ගෞරවයෙන් පිළිගෙන කටයුතු කරන අයුරු විස්තර කරන්න. (ලකුණු 05)

05. ගත ලෙඩ වුව ද සිත ලෙඩ නොකරගත යුතු බව දේශනා කළ බුදුරජාණන් වහන්සේ සිතෙහි නිරෝගීකම උදෙසා භාවනාව නිර්දේශ කළ සේක. එම භාවනා අතුරින්,

i. ආනාපානසති භාවනාව යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02)

ii. ආනාපානසති භාවනාව සඳහා සූදානම් වන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

iii. භාවනාවෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 05)

06. දේශ, කාල, ජාති, ආගම් කිසිදු භේදයකින් තොරව ලොව පවත්නා සදාතනික යථාර්ථය පෙන්වා දෙන, සියලු කෙලෙස් නැසූ ආර්ය උතුමන් වහන්සේලා අවබෝධ කරගත් උතුම් සත්‍ය හතර, 'චතුරාර්ය සත්‍යය' නමින් හැඳින්වේ.

i. එම චතුරාර්ය සත්‍යය අතුරින් පළමුවන ආර්ය සත්‍ය දෙක ලියා දක්වන්න. (ලකුණු 02)

ii. ත්‍රිවිධ තණ්හා නම් කරන්න. (ලකුණු 03)

iii. අධික තෘෂ්ණාවෙන් මිදී සරල චාම් ජීවිතයක් ගතකිරීමට ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග පහක් ලියන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. බුදු බව පැතූ බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමි

ii. දැහැමි රැකියා

iii. අත්තූපනායික ධර්ම පර්යාය

iv. මහින්දාගමනය (ලකුණු 5x2=10)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය |
| පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

I කොටස

| අනු අංකය | පිළිතුර | අනු අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 02 | 11 | 01 |
| 02 | 03 | 12 | 03 |
| 03 | 03 | 13 | 04 |
| 04 | 01 | 14 | 02 |
| 05 | 04 | 15 | 02 |
| 06 | 02 | 16 | 01 |
| 07 | 03 | 17 | 02 |
| 08 | 02 | 18 | 04 |
| 09 | 02 | 19 | 02 |
| 10 | 01 | 20 | 02 |

II කොටස

01. i. නොකර පව්කම් කරමු පින්කම්.

ii. ධම්මපද ගාථා ගායනය.

iii. ගාථාවක් නිවැරදිව හා තාලයට ගායනා කිරීමේ හැකියාව.

අදාල ධම්මපද ගාථා මතකයෙන් ගායනා කිරීමට හා ලිවීමට හැකිවීම.

එම ගාථාවල අර්ථය ප්‍රකාශ කිරීමට හැකිවීම.

එම ගාථාවලින් අපේ දිවියට ගතහැකි ආදර්ශ ගෙනහැර දැක්වීමට හැකිවීම.

කර්ම විපාක පිළිගෙන අයහපතින් මිදී යහපතෙහි යෙදීමට පෙළඹීම වැනි කුසලතා දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 ක් දෙන්න.

iv. ලියා ඇති පිළිතුරු සලකා බලා නිවැරදි කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකක් දෙන්න.

v. අපගේ සිත / අපගේ මනස

vi. ගොනා පසුපස එන කරත්ත රෝදය ගොනාට දුක ගෙන දෙන්නාක් මෙන් අප කරන අකුසල කර්ම අප පසුපස ඇවිත් අපට දුක් විපාක ලබා දේ.

vii. අප කරන හොඳ නරක ක්‍රියාවලට අපගේ සිත මුල් වන බැවින් සිත රැක ගතයුතු බව

අකුසල් කළවිට එයින් දුක් විපාක ලැබෙන බව.

අපගේ සිත ආරක්ෂා කර ගැනීමට අප කටයුතු කළ යුතු බව

සැප කැමති දුක අකමැති අප විසින් අකුසල්වලින් මිදී කුසල් කළයුතු බව වැනි ආදර්ශ දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකකි.

viii. සුන්දරී පරිබ්‍රාජිකාවගේ අපවාදයට හේතුව පෙර මූනලී නම් ධූර්තයකුව ඉපිද සරභූ නම් පසේ බුදුරජාණන් වහන්සේට අපහාස කිරීම.

චිංචිමානවිකාව මුල්කරගෙන අපවාද ලැබීමට හේතුව පෙර සබ්බාභිභූ බුදුරජාණන් වහන්සේගේ නන්ද නම් ශ්‍රාවකයන් වහන්සේට 'කාමභෝගියා' යැයි දොස් නැගීම.

විටෙන් විට හිසේ රුදාවක් ඇති වූයේ පෙර මසුන් මරන පවුලක ඉපිද තම ඥාතීන් මසුන් ගොඩදා තිබෙනු දැක සතුටු සිනා පහළ කිරීම.

පෙර භවයක වෛද්‍යවරයෙක්ව ඉපිදී තමාගෙන් බෙහෙත් ලබා ගත් පුද්ගලයකු මුදල් නොදීම නිසා එම රෝගියාට ද්වේශයෙන් විරේක බෙහෙත් දීම නිසා ලෝහිතපක්ඛන්දිකා නම් අතීසාර රෝගය වැළඳීම, මෙවැනි අවස්ථාවලින් දෙකක් සඳහන් කර ඇත්නම් ලකුණු දෙකකි.

ix. සතුන් මැරීමෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, සත්‍ය කතා කිරීම, දන්දීම, අන් අයට පිහිට වීම, වැඩිහිටියන්ට සැලකීම ආදී සිසුන්ට කළ හැකි යහපත් ක්‍රියා දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකකි.

x. පරපණ නැසීමෙන් වැළකීම.

සොරකම් කිරීමෙන් වැළකීම.

කාමය වරදවා හැසිරීමෙන් වැළකීම.

බොරු කීමෙන් වැළකීම.

කේළාම් කීමෙන් වැළකීම.

රළු වචන කීමෙන් වැළකීම.

හිස් වචන කීමෙන් වැළකීම.

දැඩි ලෝභයෙන් වැළකීම.

ද්වේශයෙන් වැළකීම.

වැරදි දෘෂ්ටිවලින් වැළකීම යන දස කුසල කර්මවලින් දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකකි.

(ලකුණු 02x10=20)

02. i. ලාභ අපේක්ෂාවෙන් දුසිල්වතුන් සසුනට එකතු වීම. (ලකුණු 02)

ii.

| | |
|---|---|
| ප්‍රධානත්වය | මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ |
| ස්ථානය | පැලලුප්නුවර අශෝකාරාමය |
| දායකත්වය | ධර්මාශෝක රජතුමා |

(ලකුණු 03)

iii. ශාසනික වශයෙන් ගැටලු ඇතිවූ අවස්ථාවල ඒවා විසඳීමට ගත් ක්‍රියා මාර්ගය නම් ධර්ම සංගායනා පැවැත්වීමයි. එහිදී ගැටලුවට තනි තනිව විසඳුම් සෙවීම වෙනුවට සාමූහිකව සාකච්ඡා කර විසඳුම් සෙවීමට කටයුතු කිරීම, යම් ගැටලුවක් ඇති වූ විට ඒ සඳහා විසඳුම් සෙවීමේ දී උගත් බුද්ධිමත් අයගේ උපදෙස් ලබා ගැනීම වැදගත් බව වැනි ධර්ම සංගායනා තුළින් ලබා දෙන ආදර්ශ සමාජයේ ඇතිවන කවර හෝ ගැටලුවක් විසඳා ගැනීමට ඉතා වැදගත්වේ.

මෙම සංගායනා ආදර්ශයට ගෙන පන්තියේ සිසුන් දෙපිරිසක් අතර ඇතිවූ ගැටලුවක් විසඳීමේ දී මුලින්ම එම දෙපිරිස සමග සාකච්ඡා කර ගැටලුවට හේතු කුමක්දැයි සොයා බැලිය යුතුය. එසේම ඔවුන් දෙපිරිසම සමග සාකච්ඡා කර ඔවුන්ට ගැටලුවට හේතු පැහැදිලි කර දිය යුතුය. එසේ ගැටුම් ඇතිකර ගැනීමෙන් දෙපිරිසට ම සිදුවන අයහපත පිළිබඳ අවබෝධ කර දිය යුතු ය. එසේම තමන්ට මේ පිළිබඳ තනියෙන් තීරණ ගැනීමට පෙර පාසලේ විනය මණ්ඩලයෙන්, පන්තිභාර ගුරුතුමා හෝ ගුරුතුමියගෙන්, විදුහල්පති තුමාගෙන් අවශ්‍ය උපදෙස් ලබාගත යුතුය. මෙවැනි කරුණු ඇතුළත් කරමින් ගැටලුව විසඳන අයුරු පැහැදිලි කර ඇතිවිට පිළිතුර සමස්තයක් සේ සලකා ලකුණු දෙන්න.

(ලකුණු 05)

03. i. සුකරානි අසාධූනි

අත්තනෝ අහිතානී ච

යං වේ හිතං ච සාධුංච

තංවේ පරම දුක්කරං (ලකුණු 02)

ii. තමාට අහිත පිණිස පවතින අයහපත් දේ කිරීම පහසුය. තමාට හිත පිණිස පවතින යහපත් දේ කිරීම ඉතා අපහසුය. (ලකුණු 03)

iii. මෙම ගාථාවෙන් අපට ලබා දෙන වටිනා උපදේශය නම් තමාට අයහපත පිණිස පවතින අයහපත් දේවල් හෙවත් නරක දේවල් කිරීම පහසු බවත්, තමාට යහපත පිණිස පවතින යහපත් දේවල් කිරීම ඉතා අපහසු බවත් ය. මේ අනුව අප අපහසුවෙන් උවද කළ යුත්තෙ අපට යහපත පිණිස පවතින හොඳදේවල් ය. එසේ අයහපතින් මිදී යහපත් දේවල් කිරීමෙන් අපට යහපත් විපාක ලැබේ. අකුසල් හෙවත් අයහපත් දේ කරන්නාට මෙලොවත් පරලොවත් දෙකෙහිම දුක් විපාක විඳීමට සිදු වේ. එවැනි පුද්ගලයන් සමාජයේ යහපත් සියලු දෙනා ප්‍රතික්ෂෙප කරති. එසේම තමන් නොයෙක් වැරදි දුරාචාරවල යෙදීම නිසා තම ධනය විනාශ වී ආර්ථික පරිහානිය ද ඇති වේ. එහෙත් එවැනි දේවලින් වළකින පුද්ගලයාට එසේ නොවේ.

මෙසේ අයහපත් දෙයින් වැළකී යහපතෙහි යෙදෙන්නාට භෞතික හා ආධ්‍යාත්මික වශයෙන් මෙලොව හා පරලොව ඇතිවන යහපත පිළිබඳ විස්තර කරමින් පිළිතුරු ලියා ඇතිවිට සමස්තයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.

(ලකුණු 05)

04. i. සිගාල නම් තරුණයා අරඹයා දේශනා කර ඇත.

ii. 1. වැරදි ක්‍රියාවලින් වළක්වා ගැනීම
2. යහපත් ක්‍රියාවල යෙදවීම
3. යහපත් සිතින් ආශිර්වාද කිරීම
4. නොඇසූ දහම් ඇසීමට සැලැස්වීම
5. ඇසූ දහම් පිළිබඳ සැක ඇතොත් එම සැක දුරු කිරීම
6. සුගතියට මග කියා දීම

(ලකුණු 03)

iii. ස්වාමීන් වහන්සේ නමක් කිසියම් ශාසනික හෝ ආගමික කටයුත්තකට තම නිවසට වැඩම කළ විට ගෞරවයෙන් වැඳ පිළිගැනීම, නිවසට වැඩම කිරීමට පෙර පා ධෝවනය කිරීම හා පිස දැමීම, සුදු ඇතිරිල්ලක් දමා ආසනයක් පනවා වැඩ සිටීමට ආරාධනා කිරීම, අවස්ථාවට සුදුසු පරිදි ගිලන්පස ආදිය පූජා කිරීම, කථා කිරීමේ දී ශාසනික වචන භාවිතා කිරීම වැනි කරුණු දක්වමින් ලියා ඇති පිළිතුරකට සමස්තයක්සේ සලකා ලකුණු දෙන්න.

(ලකුණු 05)

05. i. ආශ්වාස ප්‍රශ්වාස කිරීම පිළිබඳ මෙනෙහි කිරීම / සිහියෙන් යුතුව හුස්ම ගැනීම.

(ලකුණු 02)

ii. පළමුව ඇඟ පත මුහුණ සෝදා පිරිසිදු වීම, මල් පහන් ආදී පූජා ද්‍රව්‍ය සකස්කර තැන්පත් කිරීම, සීලයක පිහිටා තෙරුවන් වැඳ, පූජා ද්‍රව්‍ය පූජා කිරීම, පිරිමි අය බද්ධ පර්යංකයෙන් හා ගැහැණු අය අර්ධ පර්යංකයෙන් අසුන් ගැනීම. දැස් පියාගෙන සිහියෙන් යුතුව ආශ්වාස ප්‍රශ්වාස කිරීම ආදී වශයෙන් ආනාපාන සති භාවනාව වඩන අයුරු කෙටියෙන් හෝ ලියා ඇත්නම් ලකුණු තුනකි.

(ලකුණු 03)

iii. සිත සන්සුන් වීම.

කෙලෙස් යටපත් වීම

ධාරණ ශක්තිය ඇතිවීම

කායික නිරෝගිකම ඇතිවීම

මානසික සහනය ඇතිවීම

සිත විසිරීමට නොදී එකඟ කර ගැනීමට හැකිවීම

පොතපත පාඩම් කිරීමේ දී පහසු වීම, මෙවැනි ප්‍රයෝජන පහක් ලියා ඇත්නම් ලකුණු පහකි.

(ලකුණු 05)

06. i. දුක්ඛ ආර්ය සත්‍යය

දුක්ඛ සමුදය ආර්ය සත්‍යය

(ලකුණු 02)

ii. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා

(ලකුණු 03)

iii. ලද දෙයින් සතුටු වීමට පුරුදු වීම.

අවශ්‍යතා තේරුම්ගෙන අනවශ්‍ය දේවල්වලින් ඈත්වීම.

මිල අධික දේවල්වලට නොගොස් අවශ්‍යතා ඉටුකර ගැනීම.

අනවශ්‍ය විලාසිතා ආදියට නොයෑම.

තරගයට හෝ අනුකරණයට නොගොස් තම අවශ්‍යතා සඳහා පමණක් වියදම් කිරීම.

මෙවැනි කරුණු 5 ක් ලියා ඇත්නම් එකකට ලකුණු 1 බැගින් ලකුණු 5 කි.

(ලකුණු

07. i. බලංගොඩ කිරිඳිගල විසූ මෙතියස්හාමි සහ හීන්මැණිකේ යන දෙමාපියන්ට දාව 1896 අගෝස්තු 23 වන දින උපන් පින්පත් කුමාරයා විලියම් නමින් හැඳින්විය. සති දෙකක් ගිය විට තම මැණියන් කලුරිය කළ අතර තම ස්වාමියාගේ අයියාගේ බිරිඳ වන යසෝහාමි අක්කාට කුමරු හදා වඩා ගැනීම භාර විය. වයස දාහතරේ දී බලංගොඩ සරණගවේසී යන නමින් පැවිදි වූ අතර, පසුව එම නම ඉවත් කර බලංගොඩ ආනන්ද මෛත්‍රේය යන නම භාවිතා කළේ ය. පාලි, සංස්කෘත, සිංහල, බුද්ධ ධර්මය ආදී විෂයයන් පිළිබඳව හා ඉංග්‍රීසි, ප්‍රංශ, ලතින් ආදී විවිධ භාෂා පිළිබඳ මැනවින් ඉගෙන ගත් උන්වහන්සේ වසර දෙකක් ආනන්ද විද්‍යාලයේ ගුරුවරයකු ලෙස ද සේවය කළේය.

උන්වහන්සේ ආරම්භ කළ බලංගොඩ ධම්මානන්ද විද්‍යාලය පසුව බලංගොඩ මධ්‍ය මහා විද්‍යාලය නමින් හැඳින්විය. 'ශ්‍රී බුද්ධ රශ්මි' නමින් ආරම්භ කළ පුවත්පතේ ආරම්භක සංස්කාරක ලෙස කටයුතු කළ අතර, උන්වහන්සේ විසින් රචනා කරන ලද 'ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍රාවදානය හෙවත් සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය' නම් ග්‍රන්ථය පිටපත් ලක්ෂයකට වඩා මුද්‍රණය කර ඇත්තේ එහි ඇති වටිනාකම නිසා ය. විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ උපකුලපති තනතුර, ශ්‍රී ලංකා අමරපුර සංඝ සභාවේ සභාපති තනතුර, සාහිත්‍ය සූරී, අග්ගමහා පණ්ඩිත, සාහිත්‍ය චක්‍රවර්ති, අභිධජ මහා රට්ඨගුරු වැනි තනතුරු හා ගෞරව නාම රාශියක් ලැබී ඇත. අපගේ දියුණුව පවතින්නේ අපසතු සම්පත්වල ප්‍රමාණය මත නොව අපගේ උත්සාහය මත බව උන් වහන්සේගේ චරිතයෙන් අපට ගත හැකි වටිනා ආදර්ශයකි.

ii. ධාර්මික රැකියාවකින් යුක්ත වීම හෙවත් නිවැරදි ජීවන වෘත්තීන්හි නියැලීම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා ආජීව යනුවෙන් හැඳින්වේ. එය ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පස්වන මාර්ග අංගයයි. මෙහිදී බුදු දහමේ නොකළ යුතු වෙළඳාම් පහක් පිළිබඳව ඉගැන්වේ. එනම්, අවි ආයුධ වෙළඳාම, සත්ව වෙළඳාම, මස්මාංශ වෙළඳාම, මත්ද්‍රව්‍ය වෙළඳාම, වසවිස වෙළඳාම ආදියෙන් වැළකීමයි. එසේම ධාර්මික රැකියා ලෙස ගොවිතැන, ධාර්මික වෙළඳාම, ගවපාලනය, රාජ්‍ය සේවය, වඩු කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, රියදුරු වෘත්තිය, ගුරු සේවය, වෛද්‍ය සේවය, ආදී දැහැමි රැකියා බුදු දහම අගය කර ඇත.

iii. අත්තූපනායික ධර්ම පර්යාය යනු තමන් උපමා කරගෙන අනුන් පිළිබඳ සිතා කටයුතු කිරීමයි. අනුන් තමන්ට කරනවට අකමැති කිසිවක් අපි අනුන්ට ද නොකළ යුතු ය. අන් අය තමාට හිංසා පීඩා කරනවාට අකමැති වන්නාක් මෙන් අන් අය ද ඔවුන්ට හිංසා පීඩා කරනවාට අකමැති ය. එහෙයින් අපි අන් අයට හිංසා පීඩා නොකළ යුතුය. අපේ දේවල් වෙනත් කෙනෙකු සොරකම් කරනවාට අපි අකමැතිය. එමෙන්ම අන් අයද ඔවුන්ගේ දේ සොරකම් කරනවාට අකමැති ය. මෙසේ සමාජයේ වෙසෙන හැම කෙනෙක්ම සිතා කටයුතු කරන්නේ නම් එම සමාජය ගැටුම්වලින් තොර සාමකාමී

සමාජයක් බවට පත් වේ. තම ජාතිය, ආගම පමණක් උසස් කොට සලකමින් අන්‍ය ජාතීන්, ආගම් හෙළා දැකීමට කටයුතු නොකරනු ඇත.

මෙවැනි කරුණු ඇතුළත් කරමින් පිළිතුරු ලියා ඇතිවිට පිළිතුර සමස්තයක සේ සලකා ලකුණු ලබා දෙන්න.

iv. පොසොන් පුර පසළොස්වක පොහොය දිනයේ සිදු වූ මහින්දාගමනය නම් ඒ අසිරිමත් සිදුවීම ශ්‍රී ලාංකීය බෞද්ධ සංස්කෘතිය නව මාවතකට යොමු කිරීමට සමත් විය. මහින්දාගමනයෙන් අපට ලැබුණු දායාද රාශියකි.

ඒ අතර,

- එතෙක් පැවති යක්ෂ, නාග, දේව ඇදහිලි, ගල්, ගස්, පර්වත වන්දනාව ආදී මිථ්‍යා ඇදැහිලි හා විශ්වාස වෙනුවට ක්‍රමවත් සංවිධානාත්මක ආගමක් වූ බුදුදහම ලැබීම.
- බුදු දහම පදනම් කරගත් දැහැමි ජීවනෝපායන්ට යොමු වීම.
- 'වැවයි දාගැබයි ගමයි පන්සලයි' යන තේමාව යටතේ බෞද්ධ සංස්කෘතිය ගොඩ නැගීම.
- සියලු ගම් නියම්ගම්වල වෙහෙර විහාර ඇතිවීම, ධර්ම දේශනා, දානමය පිංකම්, පෙරහැර, පිරිත් පිංකම් ආදිය ආරම්භ කිරීම.
- වාස්තු විද්‍යාව, චිත්‍ර කලාව, කැටයම් කලාව, බෞද්ධ සාහිත්‍යය, වාරි කර්මාන්තය, අධ්‍යාපනය ආදිය ඇතිවීම.
- ශ්‍රී ලාංකික ජනයා පස්පව්න් වැළකී දැහැමි ජීවිත ගත කිරීමට හුරුවීම.
- සතර බ්‍රහ්ම විහරණ, සතර සංග්‍ර වස්තු, සතර අගතියෙන් තොරවීම වැනි උතුම් ගුණාංග ජීවිතයට එකතු වීම.

  මෙවැනි මහින්දාගමනය පිළිබඳ තොරතුරු හා එමගින් අපට ලැබුණු දායාද ඇතුළත් වන සේ සාර්ථකව පිළිතුරු ලියා ඇතිවිට සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 05x2=10)

LOL.lk
**BookStore**

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

**ඕනෑම පොතක් ඉක්මනින්**
**නිවසටම ගෙන්වා ගන්න**





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

**පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,**
**කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා**
**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**